කොළොන්නාව නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 15 දින සභාවේ ලේකම්වරියට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොලොන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකුලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කොම්පෝස්ට් අංගනයේ කඩා වැටීමෙන් සභාවේ භාණ්ඩ වලට සිදු වූ අලාභය රු.266,239 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) වර්ෂයේ වරිපනම් ආදායම හා හිඟහිටි වරිපනම් ගිණුම රු.1,186,884 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) උපාධිධාරී දීමනා රු.76,354 ක් අත්තිකාරම් ගිණුමේ ඉදිරියට ගෙන ඒම නිසා සමුච්චිත අරමුදල හා අත්තිකාරම් ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) අවසාන තොගය රු.136,732 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2015 වර්ෂයේදී රු.6,900 කට මිලදී ගත් භාණ්ඩ තොගයක් රු.9,600 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා තොග ගිණුම රු.2,700 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) පෙර වර්ෂ වලින් ඉදිරියට ගෙන එන ලද තැන්පත් ශේෂය වැරදි ලෙස සටහන් කිරීම නිසා ජංගම වත්කම් සහ ජංගම බැරකම් රු.299,949 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) පෙර වර්ෂ වලට අදාලව කර්මාන්ත සම්බන්ධයෙන් ලැබී තිබුණු පෝරම අලෙවියෙන් ලද මුදල් වටිනාකම රු.232,875 ක් තැන්පතු ගිණුමේ සටහන් කිරීම නිසා එම වටිනාකමින් සමුච්චිත අරමුදල අඩුවෙන් හා ජංගම වගකීම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) වැඩිපුර අයකර ගත් රු.10,164 ක සේවක ණය වාරික සේවක ණය ශේෂයට එරෙහිව කපා හැරීම නිසා සේවක ණය ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
---------------------------

ගිණුම් විෂයන් 4 කට අදාලව ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.66,422,333 ක් වූ අතර ඊට අදාල උපයෝගී ලේඛණ / වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.46,840,092 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
----------------------------------

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්
------------------------------------

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සභාපතිවරයාට යොමු කල විගණන විමසුම් 03 ක් සඳහා 2017 ජුනි මස වන විටද පිළිතුරු සපයා නොතිබුණි.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම
---------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.67,438,727 ක් වූ ගනුදෙනු, විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.34,896,256 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.53,261,623 ක් විය.

2.2 මූල්‍ය පාලනය
-------------------

වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මහජන බැංකු ජංගම ගිණුමේ ශේෂය රු.666,509 ක් වුවද බැංකු ප්‍රකාශන අනුව එම ශේෂය රු.88,436 ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට එම බැංකු සැසඳුම් ප්‍රකාශයේ වර්ෂ ගණනාවක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පැවති උපලබ්ධි නොවූ චෙක්, බැංකු දෝෂ හා මුදල් මාරු කිරීම් රු.787,099 ක් එකතු කර සහ රු. 323,195 ක් එම ශේෂයෙන් අඩු කර තිබුණ ද අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හිඟ ආදායම්
----------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාව විසින් ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තු ගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2016 | | | | 2015 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් විෂයය** | **2016 ජනවාරි හිඟ ශේෂය** | **බිල් කිරීම** | තථ්‍ය අයකර ගැනීම | **2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** | **2015 ජනවාරි 01 දිනට හිඟ ශේෂය** | **වර්ෂයේ බිල් කිරීම්** | තථ්‍ය අයකර ගැනීම | **2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 43,857,302 | 61,888,299 | 70,424,501 | 35,321,100 | 35,370,301 | 67,718,253 | 59,231,282 | 43,857,302 |
| බලපත්‍ර ගාස්තු | 42,200 | 396,750 | 395,500 | 43,450 | 3,350 | 355,600 | 316,750 | 42,200 |
| කර්මාන්ත හා ව්‍යාපාර බදු | 756,741 | 861,900 | 864,900 | 753,741 | 771,691 | 872,600 | 887,550 | 756,741 |
| කුලී ආදායම | 3,351,767 | 7,645,458 | 7,118,317 | 3,878,907 | 2,029,634 | 4,163,532 | 2,841,399 | 3,351,767 |

### 2.3.2 වරිපනම් බදු

රු.50,000 ට වඩා හිඟ හිටි රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දේපළ 42 කින් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු හිඟ වරිපනම් වටිනාකම රු.20,472,350 ක් විය. මෙම හිඟ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති මුළු හිඟ වරිපනම් වටිනාකමින් සියයට 58 ක් විය.

### 2.3.3 බදු කුලී

(අ) සභාව සතු දේපළ පැවරිම මත 2016 වර්ෂය තුල කිසිදු බදු කුලියක් අයවී නොතිබුණු ආයතන දෙකකින් ලැබිය යුතු මුදල රු.44,850 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නගර සභා ආපන ශාලාව කාර්තුවකට රු.13,740 බැගින්, ටෙන්ඩර් කර බදු දී තිබූ අතර බදු කාලය සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වීම නිසා ආපන ශාලාව වසා තිබුණි. 2016 වසරේ පළමු කාර්තුවට පමණක් බදු මුදල් ගෙවා තිබූ අතර ප්‍රවර්තන වර්ෂයේ ඉතිරි කාලයට අදාල හිඟ කුලී මුදල වූ රු.27,480 ක් 2017 මැයි 30 දින වන විටත් අය කරගෙන නොතිබුණි.

(ඇ) 2016 වර්ෂය තුල කිසිදු කුලී වාරිකයක් හෝ හිඟ වාරික නොගෙවූ වෙළඳසැල් 7 කින් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු කුලී වටිනාකම රු.691,370 ක් වූ අතර මාස 12 කට වඩා වැඩි කාලයක් හිඟ හිටි වෙළඳසැල් වලින් අයවිය යුතු මුළු හිඟ කුලීය රු.860,826 ක් විය.

2.3.4 ව්‍යාපාර හා කර්මාන්ත බදු

-----------------------------

ඉකුත් වර්ෂය වෙනුවෙන් සභාවට ලැබිය යුතුව තිබුනු රු.756,741කින් ප්‍රවර්තන වර්ෂයේදී අයකර ගෙන තිබුනේ රු.3,000 ක් හෙවත් සියයට 0.4 ක් පමණක් වූ අතර ඉතිරි හිඟ මුදල වූ රු.753,741 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයට සඳහා අනුමත කාර්ය මණ්ඩල විස්තරයට අනුව සභාවේ ලේකම් තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III/II කාණ්ඩයට හා ගණකාධිකාරී තනතුර ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III/II කාණ්ඩයට අයත් නිලධාරියකු විය යුතුය. එහෙත් ලේකම් තනතුරට කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ නිලධාරියකු සහ ගණකාධිකාරි තනතුරට කළමනාකරණ සහකාර I ශ්‍රේණියේ නිලධාරිනියක වැඩ බැලීම සඳහා පත් කර තිබුණි. තවද පරිපාලන නිලධාරි තනතුර ද පුරප්පාඩු වී පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂවල එකතුව රු.37,431,534 ක් වූ අතර ඉන් ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය අයගේ හිඟ ණය ශේෂ රු.3,552,017 ක් විය. එය සමස්ථ අයවිය යුතු හිඟ සේවක ණය ශේෂයෙන් සියයට 9 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ගබඩා ද්‍රව්‍ය පිළිබඳ සමීක්ෂණ වාර්තා අනුව ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛණය වසර ගණනාවක් යාවත් කාලීන කර නොතිබීම, ඉන්වෙන්ට්‍රි භාණ්ඩ භාරව සිටි නිලධාරින් ස්ථාන මාරු වී යාමේදි ගබඩාවට භාර ගැනීම සම්බන්ධ වාර්තා නිවැරදිව තබාගෙන නොතිබීම, භාණ්ඩ නිකුත් කිරීමේ සෑම අවස්ථාවකම නිකුත් කිරීමේ පතකින් භාර දීමට කටයුතු නොකිරීම වැනි හේතු නිසා මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු.35,631,670 ක් වූ පොදු ගබඩා ශේෂයෙහි නිරවද්‍යතාව පිළිගත නොහැකි විය.

3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

--------------------------------

2014 වර්ෂයේදී ක්‍රියාත්මක කල ආර්ථික සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් සභාවේ පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබා දුන් රු.100,000 ක මුදල අදාල වියදම් පියවා ගැනීම සඳහා යොදා නොගෙන ලේකම් සහ සභාපති ඇතුලු නිලධාරීන් 18 දෙනෙකු අතරේ බෙදා ගෙන තිබුණි.

3.3 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

එකතු වටිනාකම රු.9,737,730 ක් වූ වාහන 03ක් අලුත්වැඩියා කිරීමකින් තොරව සභා භූමියේ නිශ්ක්‍රියව පැවතුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

සභා බලප්‍රදේශයේ පිහිටි පොදු ජල කරාම 23 ක් හා ජලස්නාන ස්ථාන 12 කට අදාලව 2002 වර්ෂයට පෙර සිට සමාලෝචිත වර්ෂය දක්වා පැවත එන හිඟ ජල බිල්පත් සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු මුදල රු.48,902,698 ක් වී තිබුණි. නමුත් සභාව විසින් ඉදිරිපත් කර තිබුනු මූල්‍ය ප්‍රකාශනවල මෙම ගෙවිය යුතු වටිනාකම සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) 2016 වර්ෂය තුලදී කර්මාන්ත 25 ක් අත්හැර දමා තිබූ අතර එහි ඇස්තමේන්තු ගත පිරිවැය රු.33,060,891 ක් විය.

(ආ) 2016 වර්ෂයේදී සහා අරමුදලින් ඉටු කිරීමට නියමිත කර්මාන්ත වල ඇස්තමේන්තු වටිනාකම රු.43,106,690 ක් වූ නමුත් අයවැය ලේඛනය අනුව වෙන්කර තිබුනු ප්‍රතිපාදන වල වටිනාකම රු.29,100,000 ක් විය.

3.6 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

(අ) පළාත් පාලන කොමසාරිස් (බ.ප) ගේ අංක LGD/03/01/13 හා 2016 දෙසැම්බර් 04 දිනැති ලිපිය මගින් 2016 නොවැම්බර් 01 දින සිට රාජ්‍ය ආයතන, පාසැල් හා අනෙකුත් සියළුම ආයතනයන්හි කසල ජනනය වන ස්ථානයේදීම වෙන්කොට එකතු කිරීම අනිවාර්යය කර ඒ පිළිබඳව ආයතන ප්‍රධානීන්ට දන්වා තිබුණ ද 2017 ජුනි 12 දින වන විටත් සභාව විසින් ඊට අදාල පියවරයන් ගෙන නොතිබුණි.

(ආ) 2008 ජුලි 30 දිනැති අංක 1560/6 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ රීති වල 2 වන පරිච්ඡේදයේ 18 (1) අනුව පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදු වලට අමතරව කසළ දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා මාසික කසළ ගාස්තුවක් අයකර ගත යුතු වුවත් එසේ කසළ ගාස්තුවක් අයකර ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයට රු.10,448,400 ක් අහිමි වී තිබුණි.

(ඇ) 2016 වර්ෂය සඳහා දෛනිකව හෝ මාසිකව කසළ කළමනාකරණ වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි.

3.7 පාරිසරික ගැටළු

--------------------

කොලොන්නාව නගර සීමාවේ ඇති මීතොටමුල්ල කසල අංගනයට කොළඹ මහා නගර සභාව සහ කොලොන්නාව නගර සභාව මගින් අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් දැඩි පාරිසරික ගැටළු මෙන්ම සෞඛ්‍ය ගැටළු මතුව තිබුණි. පාරිසරික දුර්ගන්දයන් හා ප්‍රදේශයේ ළිං ජලය අපවිත්‍ර වි තිබූ අතර අවට නිවාස වල වෙසෙන ප්‍රජාව ස්වසන රෝග චර්ම රෝග හා ජලය අපවිත්‍ර වීම මත උදරආබාද රෝග වලට ලක්වූ රෝගීන් සිටින බව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ගේ වාර්තා වලින් නිරීක්ෂණය විය. මේ අනුව දිනෙන් දින ගොඩ නැගෙන කුණු කන්ද හේතුවෙන් අවට නිවාස වල වෙසෙන ප්‍රජාවගේ මානසික, පාරිසරික, සාමාජීය, හා ආර්ථික ගැටළු වලට උග්‍ර ලෙස බලපා තිබෙන බව නිරීක්ෂණය විය. 2017 අප්‍රේල් 14 දින මීතොටමුල්ල කසළ අංගණය කඩා වැටීම හේතුවෙන් සිදු වූ මිනිස් ජීවිත, පෞද්ගලික හා රාජ්‍ය දේපළ සම්බන්ධ තොරතුරු සභාව විසින් ඉදිරිපත් නොකිරීම නිසා ප්‍රමාණවත් විගණනයක් කිරීමට නොහැකි විය.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

------------------------------------------

4. 1 අයවැය පාලනය

-------------------

අයවැය හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------------

2003 ජූනි 02 දින හා අංක PED/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව නගර සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන අංශය සඳහා නිලධාරියෙකු පත්කර තිබුණද 2016 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩ සටහන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. අභ්‍යන්තර විගණනයක්ද සිදුකර නොතිබුණි.

4.4 විගණන හා කළමණාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

----------------------------------------------------------

2003 ජූනි 03 දිනැති PED 12 චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් තුල පැවැත්විය යුතු අවම විගණන හා කළමනාකරණ කමිටු සංඛ්‍යාව පවත්වා නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය

(ඇ) තොග පාලනය

(ඈ) ආදායම් පාලනය

(ඉ) කොන්ත්‍රාත් පාලනය

(ඊ) අභ්‍යන්තර විගණනය